# ව්‍යාපාර අධ්‍යයනය

## 8.2 රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම විමසීම

## (අභ්‍යාස)





## අභ්‍යාස .1

1. පහත සඳහන් දෑ අතුරින් රක්ෂණ මූලධර්ම තෝරන්න.
2. ජීවිත රක්ෂණයට පමණක් බලපාන මූලධර්ම නම් කරන්න.

A - වලංගු ගිවිසුමක් තිබීම
B - දායකත්වය
C - උපරිම විශ්වාසය
D - රක්ෂණ හිමිකම
E - ආදේශනය
F - ආසන්නතම හේතුව
G - අවදානම අන්තර්ගත වීම
H - ආවරණය කරන කාලය
I - හානි පූර්ණය

| 1 රක්ෂණ මූලධර්ම | 2 ජීවිත රක්ෂණයට පමණක් බලපාන මූලධර්ම |
| --- | --- |
| | |



Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- ඒ දයාල් පීරිස් මයා. ගුරුළුගෝමී මහ විදුහල, කළුතර.
සැකසුම :- ප්‍රමෝද්‍යා වර්ණකුළ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන මයා , රාජකීය විද්‍යාලය හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අභ්‍යාස .2

පහත සඳහන් සිද්ධීන් හා අදාළ රක්ෂණ මූලධර්මය සඳහන් කරන්න.

1. තුෂාන් පෙරේරා රු. ලක්ෂ 45 ක් වටිනා තම නිවස XY රක්ෂණ ආයතනයේ රක්ෂණය කරන ලදී. නිවසේ ඇති වූ ගින්නක් නිසා නිවසට සිදු වූ අලාභය රු. ලක්ෂ 12 ක් වේ. වන්දි ලෙස තුෂාන් පෙරේරාට ගෙවන ලද මුදල රු. ලක්ෂ 12ක් වේ. ........................................................................

2. අයේෂ් සිරිවර්ධන රු. ලක්ෂ 20ක් වටිනා හදිසි අනතුරු රක්ෂණ ආවරණයක් සලසා ගෙන තිබුණි. රක්ෂණ ඔප්පුවේ කාල සීමාව තුළ දී අයේෂ් පපුවේ අමාරුවක් ඇති වී රෝහල්ගත කිරීමෙන් පසු මිය ගියේ ය. රක්ෂණ ආයතනය අයේෂ්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී.
...................................................................................

3. මලින්ද ෆොන්සේකා රු. ලක්ෂ 48ක් වටිනා තමාට අයත් ගොඩනැගිල්ල රක්ෂණය කර ඇත. මලින්ද මෙම ගොඩනැගිල්ල සිය මිතුරෙකු වූ ලලිත් කුමාරට කුලී පදනම යටතේ ලබා දී ඇත. එම කාලය තුළ ගොඩනැගිල්ලේ ඇති වූ ගින්නක් නිසා සිදු වූ අලාභය සඳහා රක්ෂණ ආයතනයෙන් මලින්දට වන්දි හිමි වූ අතර, පසුව මලින්ද , ලලිත්ගෙන් වන්දි මුදලක් ලබා ගැනීමට උත්සාහ කරන ලදී. මෙහි දී ලලිත්ගෙන් ලබා ගැනීමට කටයුතු කළ වන්දි මුදල මලින්දට හිමි නො වූ අතර එය රක්ෂණ ආයතනය ලබා ගන්නා ලදී. ......................................................

4. ජගත් පිටිගල රු. ලක්ෂ 30ක් වටිනා තම නිවස P, Q හා R යන රක්ෂණ ආයතන තුනක පිළිවෙළින් රු. ලක්ෂ 15, ලක්ෂ 10 හා ලක්ෂ 5 බැගින් රක්ෂණය කර ඇත. මෙවන් තත්ත්වයක් යටතේ නිවසට සිදු වූ අලාභයක දී P ,Q හා R රක්ෂණ ආයතන තුන ම සම්බන්ධ වී වන්දි ගෙවීම.
.............................................................

5. ඉරාන් රසන්ත සිය ජීවිතය වෙනුවෙන් රු. ලක්ෂ 25ක් වටිනා රක්ෂණ ආවරණයක් සලසා ගන්නා ලදී. නමුත් තමාට පවතින නිදන්ගත රෝගය පිළිබඳ තොරතුරු රක්ෂණ ආයතනයට නොසැපයීමට ඔහු තීරණය කරන ලදී. පුරා වසර 6ක් රක්ෂණ වාරික ගෙවමින් සිටිය දී පැවති නිදන්ගත රෝගය හේතුවෙන් ඔහු මිය ගිය අතර ඔහුගේ යැපෙන්නන් රක්ෂණ වන්දි මුදල් ඉල්ලා සිටි නමුත් , වන්දි ගෙවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කරන ලදී.
..................................................................

6. ලූෂන් අල්වාරිස් තම ඥාති සොහොයුරෙකු වන ඩිහාන් මංජුලගේ ජීවිතය රක්ෂණය කිරීමට AB රක්ෂණ ආයතනය වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලදී . මෙම අයදුම් පත්‍රය රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කිරීම. ...............................................................

## අභ්‍යාස .3

රක්ෂණ මූලධර්ම , රක්ෂණය කෙරෙහි කෙසේ වැදගත් වන්නේ දැයි සඳහන් කරන්න.

..................................................................................................................
..................................................................................................................
..................................................................................................................

අන්තර්ගතය :- ඒ දයාල් පීරිස් මයා. ගුරුළුගෝමී මහ විදුහල, කළුතර.
සැකසුම :- ප්‍රමෝද්‍යා වර්ණකුළ මයා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන මයා , රාජකීය විද්‍යාලය හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk